# ප්‍රශ්නයේ මුල

බලය බෙදීම යන්න නැවතත් සාකච්ඡාවට භාජනය වී ඇත. සර්වපාක්ෂික නියෝජිත කමිටුවේ සමාජික පක්ෂ උපරිම ලෙස බලය බෙදීමට එකඟ බවට ප්‍රකාශයක් නිකුත්වීමෙන් පසු ඒ පිළිබඳ කතාව නැවතත් ආරම්භ වී ඇත. බලය බෙදන්නේ කුමක් සඳහා ද, එනම් කිනම් ප්‍රශ්නයක් විසදීම සඳහා ද, බලය බෙදීම යන්නෙන් අදහස්කෙරෙන්නේ කුමක් ද, කෙතරම් බලයක් බෙදිය යුතු ද ආදිය මෙහි දී වැදගත්වෙයි. ඒ සාකච්ඡාකිරීමට පෙර කිවයුත්තක් වෙයි. උපරිම ලෙස බලය බෙදීමට නියෝජිත කමිටුවේ කිසිම එකඟතාවක් නොමැත. උපරිම ලෙස බලය බෙදීම යන්නෙන් සඟසන්ධීය රාජ්‍යයක් වුව ද ලබාදිය හැකි බව ගම්‍ය වෙයි. බලය බෙදීමට එකඟය යන්නෙන් ඒ සඳහා කොන්දේසි විරහිතව එකඟය යන්නක් අදහස් නොවෙයි. ඇතැම් පක්ෂයක් එකඟ වී ඇත්තේ කොන්දේසි මත ඒකීය රාජ්‍යයක යම් බලයක් බෙදීමට පමණ ය. ඒ කොන්දේසි පැනවෙන්නේ ප්‍රශ්නය කුමක් ද යන්න අවබෝධකරගන්නා අන්දමින් බව ද පැහැදිලිවිය යුතු ය. එහි දී අනිවාර්යයෙන් ම දෙමළ ජනයා නියෝජනයකරන පක්ෂ බලය බෙදන ලෙස ඉල්ලන්නේ කුමක් මත පදනම් වී ද යන්නත් දැනගැනීම වැදගත් ය. ඔවුන් කියන්නේ එකම එක කරුණකි. ඔවුහු දෙමළ අභිලාෂයක් ගැන කතාකරති. ඒ අභිලාෂය අන් කිසිවක් නොව දෙමළ ජනයා වැඩිපුර වාසයකරන උතුරු හා නැගෙනහිර පළාත්වල තමන්ට තම කටයුතු කරගෙනයෑම සඳහා බලය ලබාගැනීම ය. ඔවුන්ට අවශ්‍ය බලය ව්‍යවස්ථාදායක බලය බව ද පැහැදිලි ය. මෙහි දී කිවයුත්තක් නම් උතුරු හා නැගෙනහිර පළාත් දෙමළ නිජභූමි යන සංකල්පය සර්වපාක්ෂික නියෝජිත කමිටුවේ කිසිම පක්ෂයක් දැන් ඉදිරිපත් නොකරන බව ය.

දෙමළ ජනයා කියන අන්දමට ඔවුන්ට මේ අභිලාෂය ඇතිවී තිබෙන්නේ සිංහල බහුතරය විසින් ව්‍යවස්ථාදායකයේ දී දෙමළ අවශ්‍යතා නොතකාහැරීම හේතුවෙන් ය. එබැවින් ඔවුහු දෙමළ යැයි කියන ප්‍රදේශවල තමන්ගේ වැඩ තමන්ට රිසි අයුරින් කරගෙන යෑමට බලය ලබාගැනීමේ අභිලාෂයෙන් පසුවෙති. ඔවුන් කියන අන්දමට ව්‍යවස්ථාදායක සභාව පිහිටවූ මුල් කාලයෙහි එහි සාමාජික සංඛ්‍යාව සිංහල හා දෙමළ ජනකොටස් අතර සමසමව හෝ අඩුම තරමින් දෙකට එක අනුපාතයෙන් විණි. එහෙත් ක්‍රමයෙන් ඡන්දබලය දෙනු ලැබීමෙන් පසුව මේ අනුපාතය සිංහලයන්ගේ පැත්තට තව තවත් වැඩිවිය. මුස්ලිම් නියෝජිතයෝ ද පසු කලෙක ව්‍යවස්ථාදායකයට පත්වූහ. පසුගිය සියවසේ තිහේ දශකය පමණ වන විට ජී. ජී. පොන්නම්බලම් මහතා පනහට පනහ යෝජනාව ගෙන ආවේ කිසිම ජන කොටසකට රාජ්‍ය මණ්ත්‍රණ සභාවේ අනෙක් ජනකොටස් සමග එකතු නොවී තම හිතුමතයට පමණක් වැඩකිරීමට ඉඩනොදීමට ය. සිංහලයන් 70%ට වැඩියෙන් සිටිය ද දෙමළ ජාතිවාදීන්ට අවශ්‍ය වුයේ සිංහල නියෝජිතයන්ගේ ප්‍රතිශතය 50% වඩා අඩු කිරීමට ය. වෙනත් අයුරකින් කියන්නේ නම් සිංහලයන්ට හිමි තැන අහිමිකිරීම ය. වඩා පළල්ව කිවහොත් සිංහලත්වයට, එනම් සිංහල ජාතියට, සිංහල භාෂාවට, සිංහල සංස්කෘතියට හිමි තැන අහිමිකිරීමට ය.

මුල් කාලයේදී ප්‍රභුවරුන්ට ද කිසිම වූ ආකාරයක ඡන්ද බලයක් නොතිබූ අවධියෙහි බ්‍රිතාන්‍යන් ව්‍යවස්ථාදායක සභාවට ඒ ඒ ජාතීන් හා ජනවර්ග වෙනුවෙන් නියෝජිතයන් පත්කිරීමෙහි දී සිංහල හා දෙමළ ජනයා වෙනුවෙන් එක් අයකු බැගින් පත්කෙළේ එක් පැත්තකින් බෙදා පාලනයකිරීම පහසුකිරීම සඳහා ය. අනෙක් පැත්තෙන් ඉංගිරිසි උගත් හා වරප්‍රසාද ලත් ප්‍රභූන් අතර සිංහලයන්ට සරිසරිව දෙමළ ජනයා ද සිටීම ය. දෙමළ ප්‍රභූහු ව්‍යවස්ථාදායක සභාවෙහි සෑම කලකම සංඛ්‍යාත්මක ව සිංහලයන් සමග සමාන තත්ත්වයක් බලාපොරොත්තු වූහ. ඡන්ද බලය ක්‍රමයෙන් ජනතාව අතට පත්වත්ම ඒ සමානත්වය නැතිවන විට දෙමළ ප්‍රභූහු තැතිගත්හ. ඒ ඔවුන් බ්‍රිතාන්‍යන්ගෙන් ලබා තිබූ වරප්‍රසාද ආදිය නැතිවන බව දැනගත් බැවිනි. ඒ වරප්‍රසාද රැකගැනීම සඳහා ඔවුහු පනහට පනහ වැනි යෝජනා ගෙන ආහ. එවැනි යෝජනා 1915 පමණ සිට ගෙනැවිත් තිබුණ ද, හතළිස් හතේ මැතිවරණයෙන් පසුව එවකට ඇතිකර තිබූ ව්‍යවස්ථාදායකයෙහි, එනම් පාර්ලිමේන්තුවෙහි, සිංහල මන්ත්‍රී සංඛ්‍යාව, දෙමළ හා අනෙක් මන්ත්‍රී සංඛ්‍යාවට වඩා වැඩිවීම තවදුරටත් වැළැක්විය නොහැකි බව අඩුම තරමින් චෙල්වනායගම් මහතාට හා ඒ මහතා වටා සිටි කිහිප දෙනකුට අවබෝධ විය. චෙල්වනායගම් මහතා හතළිහේ දශකයේ අග භාගයෙහි ෆෙඩරල් පක්ෂය නමින් ප්‍රසිද්ධ වූ ඉලංකෙයි තමිල් අරසු කච්චි හෙවත් ලංකා දෙමළ රාජ්‍ය පක්ෂය පිහිටුවා උතුරු හා නැගෙනහිර පළාත්වලට වෙනම රාජ්‍යයක් දිනාගැනීමට කටයුතු කෙළේ ය.

ඔහු හා ඔහුගේ සගයන් ඉන් බලාපොරොත්තු වුයේ ඒ පළාත් දෙකෙහි තමන්ගේ වැඩකටයුතු තමන්ටම කරගෙන යෑමේ තත්ත්වයක් ඇතිකර ගැනීම ය. දෙමළ පක්ෂ තම මතය ඉදිරිපත්කරන ආකාරයට, දෙමළ ජනයාට වඩාත්ම ප්‍රශ්නය

© Prof. Nalin De Silva

වී ඇත්තේ ව්‍යවස්ථාදායකයෙහි සිංහල බහුතරය තම බහුතර ඡන්දය යොදාගනිමින් දෙමළ ජනයාට බලපාන ප්‍රශ්නවලදීත් දෙමළ ජනයාගේ අදහස්වලට සවන් නොදී තීරණගැනීම ය. අද ඇතැම් දෙමළ පක්ෂ සඳහන්කරන ආකාරයට මුල දී ව්‍යවස්ථාදායකයෙහි, එනම් ව්‍යවස්ථාදායක මණ්ඩලයෙහි මන්ත්‍රීන් බ්‍රිතානි ආණ්ඩුකාරයා විසින් පත්කරනු ලැබුයේ ජනවාර්ගික පදනමකිනි. මුල් ම අවස්ථාවෙහි දී සිංහල, දෙමළ, බර්ගර් ජනයා වෙනුවෙන් එක් මන්ත්‍රීවරයකු බැගින් පත්කරනු ලැබිණි. දෙමළ පක්ෂවලට අනුව ඒ පත්කිරීම් ඔස්සේ සිංහල හා දෙමළ ජනයා සම තත්ත්වයෙහි ලා සලකනු ලැබිණි. එහෙත් පසුව භෞමික පදනමකින්, එනම් දිවයින භෞමික වශයෙන් ඡන්ද කොට්ඨාශවලට බෙදා ඒ අනුව මන්ත්‍රීන් තෝරා පත්කරගැනීමේ දී ඒ සමානත්වය නොමැතිවිය. මුළු දිවයිනම සම්බන්ධයෙන් ගත්කල කලින් තිබූ සමානත්වය එසේ නැතිවීම පිළිබඳව දෙමළ පක්ෂ තම විරෝධය පළ කර සිටියි. පසු කලෙක පාර්ලිමේන්තුව පිහිටුවීමෙන් පසුව ද ඇතැම් ආසන බහුමන්ත්‍රී ආසන බවට පත්කරනු ලැබුයේත්, ඇතැම් ජනවර්ග වෙනුවෙන්, මුළු සංඛ්‍යාව හයදෙනකු වන ලෙස, මන්ත්‍රීන් පත්කරනු ලැබුයේත් සිංහලයන්ට වැඩි මන්ත්‍රී සංඛ්‍යාවක් ලුබීම හැකිතාක් අවමකිරීම සඳහා ය. දෙමළ ප්‍රභූන්ට එදා අවශ්‍ය වී තිබුණේ කිසියම් හෝ ක්‍රමයකින් පාර්ලිමේන්තුවේ සිංහල මන්ත්‍රී සංඛ්‍යාවේ පතිශතය මුළු රටේම සිංහල ප්‍රතිශතයට වඩා බෙහෙවින් අඩුකිරීම ය. රටේ සිංහල ප්‍රතිශතය 70%ට වැඩි වුව ද, පාර්ලිමේන්තුවේ සිංහල මන්ත්‍රී සංඛ්‍යාව 50%ට වඩා අඩුකිරීම දෙමළ ප්‍රභූන්ගේ අරමුණ විය.

දෙමළ ප්‍රභූන් සෝල්බරි කොමිසම ඉදිරියට ගොස් සාක්ෂි  දුන්නේ ද ඒ අරමුණෙන් ය. ඒ කොතරම් තදින් කියා සිටියේ ද කිවහොත් කෘත්‍රිම ආකාරයකින් බහුතරයක් සුළුතරයක් බවට පත්කිරීමට නොහැකි යැයි කීමට සෝල්බරි සාමිට පවා සිදුවිය. දෙමළ ජනයා සිංහල ජනයා සමග සම තත්ත්වයක ලා සැලකීමට දෙමළ ප්‍රභූන් ක්‍රියා කෙළේ බ්‍රිතානීන්ගේ උසිගැන්වීම මත ය. එහි දී බලපෑ ප්‍රධානම කරුණ වූයේ ප්‍රභූන් අතර සිංහල හා දෙමළ ජනයා සංඛ්‍යාත්මක ව ගත්කල අඩුවැඩි වශයෙන් සමාන වීම ය. අධ්‍යාපන හා වෙනත් පහසුකම් හේතුකොටගෙන මේ තත්ත්වය උදාවිය. බ්‍රිතානීහු මුල දී සිංහල හා දෙමළ ජනකොටස් මෙරට ප්‍රධාන ජනවර්ග දෙක ලෙස හැඳින්වූහ. එමගින් දෙමළ ප්‍රභූන්ට වැරදි වැටහීමක් ලබාදුන්හ. ඒ වැරදි වැටහීම මත පදනම් ව දෙමළ ප්‍රභූහු ක්‍රියාකළහ. එහෙත් 1920න් පමණ පසුව බ්‍රිතානීහු මේ පදනම වෙනස්කළහ. ඒ වන විට ඉතා සීමිත ඡන්ද බලයක් ප්‍රභූන්ට හිමි වී ව්‍යවස්ථාදායක සභාවේ සිංහල මන්ත්‍රී සංඛ්‍යාව දෙමළ මන්ත්‍රී සංඛ්‍යාවට වඩා එකකින් වැඩි වී තිබුණු අතර පොන්නම්බලම් අරුනාශලම් මහතා ආදීන් ව්‍යවස්ථාදායක සභාවට බස්නාහිර පළාතේ දෙමළ ජනයා වෙනුවෙන් මන්ත්‍රීවරයකු තෝරාපත්කරගැනීම සඳහා සටනක් අරඹා තිබුණි. මේ අවධියෙහි මෙරට බ්‍රිතානි ආණ්ඩුකාරයා ලෙස මැනිං පත්වී තිබිණි. ඔහු මේ ප්‍රශ්නය අවුල්කිරීම සඳහා කළහැකි සෑමදෙයක්ම කෙළේ ය. ඔහු සිංහල ප්‍රභූන් හා දෙමළ ප්‍රභූන් අතර මේ වන විට ඇතිවූ තිබුණු විරෝධ ආකල්ප තම වාසියට යොදාගෙන සිංහලයන්ට විරුද්ධව දෙමළ ප්‍රභූන් උසිගැන්වී ය. එතෙක් මෙරට ප්‍රධාන ජනවර්යක් ලෙස හැඳින්වුණු දෙමළ ජනයා ඉන්පසු සුළු ජනවර්ගයක් ලෙස හැඳින්විණි. සිංහලයන් බහුතර ජනවර්ගය ලෙසත් දෙමළ සුළුතර ජනවර්ගය ලෙසත් හැඳින්වීමේ ප්‍රතිඵලය වූයේ දෙමළ ප්‍රභූන් තම ඊනියා අයිතිවාසිකම් දිනාගැනීමට තව තවත් උනන්දුවෙන් කටයුතුකිරීම ය.  බ්‍රිතානීන් සිංහල හා දෙමළ මෙරට ප්‍රධාන ජනකොටස් දෙක ලෙස හැඳින්වීම මෙන් ම බහුතර හා සුළුතර ලෙස හැඳින්වීම ද වැරදි ය. මෙරට සිංහලත්වයට හිමි විය යුතු තැන ඒ කරුණු දෙකින් ම නැතිවිය. පුද්ගලයන් අතර සමානත්වයක් තිබීම, පුද්ගලයන් එක හා සමාන තත්ත්වයෙන් සැලකීම ආදිය කිසිවකුටවත් විරුද්ධ විය හැකි කරුණු නො වේ. එහෙත් මෙහි ද ව්‍යතිරේක තිබෙන බව අමතක නොකළ යුතු ය. පෙරදිග සංස්කෘතීන්හි දෙමව්පියෝ දරුවන් හා සම තත්ත්වයෙහි ලා නො සැලකෙති. ගුරු ශිෂ්‍ය සම්බන්ධය ද අසමමිතික සම්බන්ධයකි. එවැනි අසමමිතික තිබුණ ද සාමාන්‍යයෙන් සිවිල් පුරවැසියන් ලෙස ගත්කල පුදගලයෝ එකිනෙකාට සමානවෙති. එහෙත් රටක සංස්කෘතීන් එලෙස සමාන නො වෙයි. රටක ඉතිහාසය සංස්කෘතිය නොසලකා ජනවර්ග ලෙස එකිනෙක සමානකිරීම හෝ හුදෙක් සංඛ්‍යාව මත පදනම් ව මහාජාතිය සුළුජාතිය ආදී වශයෙන් නම්කිරීම හෝ වැරදි ය. මෙරට සිංහලත්වයට හිමි තැනක් ඇත. සිංහල සංස්කෘතිය මෙරට හර සංස්කෘතිය වෙයි. එංගලන්තයේ පමණක් නොව අයර්ලන්තය, ස්කොට්ලන්තය හා වේල්සය ද  ද ඇතුළු සියළු යටත්විජිතවල ඉංගිරිසි සංස්කෘතිය ප්‍රධාන සංස්කෘතිය බවට පත්කිරීමට කටයුතුකළ බ්‍රිතානීන්ට මෙරට සිංහලත්වයට හිමි තැන අහිමිකිරීමට අවශ්‍ය විය. මෙරට ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයේ ප්‍රධාන මුල ඇත්තේ එතැන ය. අප දෙමළ පක්ෂවලට මේ කරුණ අවබෝධකර ගැනීමට සැලැස්විය යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva